<u>විස්තර පත්‍රිකාව</u>

## 1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

1.1 අධ්‍යාපන සුදුසුකම්

ඉගැන්වීමේ කාර්යයක් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් ප්‍රදානය කරනු ලැබූ **අධ්‍යාපනවේදී උපාධියක්** විය යුතුය. මෙම උපාධිය **සුදුසුකම් සලකා බලන දිනට (2024.07.31)** පෙර වලංගු උපාධියක් විය යුතුය.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස සහ ගණිතය සඳහා සාමාර්ථයන් සහිතව සම්මාන තුනක් සමඟ විෂයයන් හයක් (06) සමත් වීම. (එක් වතාවකදී අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත්ව තිබිය යුතුය.)

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදි එකවර විෂයයන් තුනක් (03) සහිතව සමත්ව තිබිය යුතුව.

**ඉතා වැදගත් :** (අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමේදී සැලකිල්ලට ගත යුතුය.)

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයය හා මාධ්‍යය පිළිබඳව අයදුම්කරුවන් සැළකිලිමත් විය යුතුය. (උපලේඛන 01 හා 02)
- එහිදී ප්‍රවීණතාවය ලද විෂයය අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතු ය.
- ඉල්ලුම් කළ හැක්කේ එක් විෂයයක් පමණි.
- ඉල්ලුම් කළ විෂයය හා මාධ්‍ය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.
- **ඔබ ඉල්ලුම් කරන විෂයය ඔබ හදාරා ඇති අධ්‍යාපනවේදී උපාධිය තුළ හදාරා ඇති බවට විශ්ව විද්‍යාලය මඟින් තහවුරු කෙරෙන ලිපියක් හා එම විෂයට අදාළව ඔබ ගුරු පුහුණුව හදාරා ඇති බවට සනාථ කෙරෙන ලිපියක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.**

1.2 කායික හා මානසික යෝග්‍යතාවය

සෑම අයදුම්කරුවෙකුම ගුරුවරයෙකු වශයෙන් රාජකාරී ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.3 වයස

සුදුසුකම් සලකා බලන දිනට (2024.07.31) වයස අවුරුදු 18ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුය.

1.4 වෙනත් සුදුසුකම්

- අයදුම්කරු/කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

- අයදුම්කරු/කාරිය විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

- පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරු/කාරි හෝ කලත්‍රයා, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුය. (ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්.04) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය.

- බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

**1.5 සුදුසුකම් සලකා බැලීමේ අවසන් දිනය - 2024.07.31**

1.6 ඉහත සඳහන් කරනු ලබන සියලුම සුදුසුකම් 2024.07.31 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

1.7 බඳවා ගැනීම් සම්බන්ධ සියලු තොරතුරු ඔබ සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS මඟින් දැනුම් දීම කරනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. පසුව SMS නොලැබීම සම්බන්ධව කරනු ලබන ඉල්ලීම් සලකා නොලැබේ.

**2. අයදුම් කළ යුතු පිළිවෙල**

2.1 අදාළ තොරතුරු ඇතුළත් කරමින්, අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත පිරවීමේදී යොමු කර ඇති උපලේඛන 01 හා 02 උපයෝගී කර ගත යුතුය.

2.2 අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙහි ඡායා පිටපතක් අයදුම්කරු සතුව තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

2.3 අයදුම් කරනු ලබන විෂයය පසුව වෙනස් කිරීමට කිසිසේත් ඉඩ නොලබන අතර එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

අයදුම්පත සමඟ කිසිඳු සහතිකයක් අමුණා නොඑවිය යුතුය

2.4 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත් යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය. එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ රු. 498,960/- ක්

හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

2.5 මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - 2024.12.08

2.6 අපගේ නිල වෙබ් අඩවියට පිවිස, මාර්ගගත ක්‍රමය මඟින් 2024.12.08 දිනට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදු කල යුතු අතර, නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව 2024.12.15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

**ලේකම්, (බඳවාගැනීම් අංශය)**
**බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**නො 628, 10 වන මහල,**
**ජනජයසිටි ගොඩනැඟිල්ල,**
**නාවල පාර, රාජගිරිය.**

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024"** ලෙස අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

2.7 අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලෙදී නැතිවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

**3. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිඳු අයුරකින් සලකා බලනු නොලැබේ.**

**4. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ. එසේම මෙම බඳවාගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.**

## උප ලේඛනය 01

| භාෂා මාධ්‍යය | කේත අංකය |
|---|---|
| සිංහල මාධ්‍යය | 1 |
| දෙමළ මාධ්‍යය | 2 |
| ඉංග්‍රීසි මාධ්‍යය | 3 |

## උප ලේඛනය 02

| අනු අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 01 | ප්‍රාථමික | අ.පො.ස (උසස් පෙළ) මව් භාෂාව විෂයක් ලෙස සමත් වී තිබීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ මව් භාෂාව ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 02 | ඉංග්‍රීසි | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 03 | නැටුම් (දේශීය) | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 04 | සංගීතය (පෙරදිග) | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 05 | විද්‍යාව | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 06 | ගණිතය | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 07 | සිංහල | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |

| | | |
|---|---|---|
| 08 | දෙමළ | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 09 | ඉතිහාසය | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 10 | බුද්ධ ධර්මය | අ.පො.ස (උසස් පෙළ) බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය විෂයන් හදාරා තිබීම හා ඉන් සමත් වී තිබීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 11 | හින්දු | අ.පො.ස (උසස් පෙළ) හින්දු විෂය හෝ හින්දු ශිෂ්ටාචාරය හදාරා තිබීම හා ඉන් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 12 | ඉස්ලාම් | අ.පො.ස (උසස් පෙළ) ඉස්ලාම් විෂය හෝඉස්ලාම් ශිෂ්ටාචාරය හදාරා තිබීම හා ඉන් සමත් වී තිබීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 13 | රෝමානු කතෝලික | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 14 | ක්‍රිස්තියානි | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 15 | භූගෝල විද්‍යාව | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 16 | පුරවැසි අධ්‍යයනය | අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස දේශපාලන විද්‍යාව විෂය හදාරා තිබීම හා ඉන් සමත් වී තිබීම සහ<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 17 | ව්‍යාපාර හා ගිණුම්කරණ | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා |

| | | |
|---|---|---|
| | අධ්‍යයනය | අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 18 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | අ.පො.ස (උසස් පෙළ) වානිජ විෂය ධාරාව හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 19 | හින්දි | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 20 | අරාබි | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 21 | චීන | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 22 | ජර්මන් | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 23 | ජපන් | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 24 | ප්‍රංශ | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 25 | කොරියන් | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 26 | දෙවන භාෂාව (සිංහල) | අ.පො.ස (සාමාන්‍ය පෙළ) සඳහා දෙවන භාෂාව (සිංහල) විෂයට A සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |

| | | |
|---|---|---|
| 27 | දෙවන භාෂාව (දෙමළ) | අ.පො.ස (සාමාන්‍ය පෙළ) සඳහා දෙවන භාෂාව (දෙමළ) විෂයට A සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 28 | සංගීතය (අපරදිග) | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 29 | සංගීතය (කර්ණාටක) | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 30 | චිත්‍ර | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 31 | නැටුම් (භාරතීය) | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 32 | නාට්‍ය හා රංග කලාව | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 33 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 34 | කෘෂි හා ආහාර තාක්ෂණය | අ.පො.ස (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව කෘෂි විද්‍යාව විෂයක් ලෙස ඇතුළත්ව හදාරා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 35 | ශිල්ප කලා | අ.පො.ස (සාමාන්‍ය පෙළ) සඳහා ශිල්ප කලා විෂයයට A සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |

| | | |
|---|---|---|
| 36 | ගෘහ ආර්ථික විද්‍යාව | අ.පො.ස (සාමාන්‍ය පෙළ) සඳහා ගෘහ ආර්ථික විද්‍යාව විෂයයට A සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 37 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යයනය | අ.පො.ස (සා.පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයට A සාමාර්ථයක් ලබා තිබීම සමග,අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම හා<br>හා ක්‍රීඩා ජයග්‍රහණ අවම වශයෙන් දිස්ත්‍රික් හෝ පළාත් මට්ටම ලබා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 38 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | අදාළ විෂය අ.පො.ස (උසස් පෙළ)විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 39 | විශේෂ අධ්‍යාපනය | අ.පො.ස (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම සහ<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ විශේෂ අධ්‍යාපනය විෂයක් ලෙස හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 40 | උපදේශනය | අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයක් වශයෙන් උපදේශනය / මනෝ විද්‍යාව හදාරා තිබීම හෝ උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබීම |
| 41 | පුස්තකාල ගුරු | අ.පො.ස (උසස් පෙළ) මව් භාෂාව විෂයක් ලෙස සමත් වී තිබීම සහ<br>අධ්‍යාපනවේදී උපාධිය තුළ මව් භාෂාව ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස හදාරා තිබීම |